කෑගල්ල ප්‍රාදේශීය සභාව,

කෑගල්ල දිස්ත්‍රික්කය

-----------------------------

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 29 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ජුනි 30 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට කෑගල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) අරමුදල් ප්‍රභවයන් දෙකක් යටතේ ගිවිසුම් අත්සන් කර නොමැති වටිනාකම රු.841,935 ක් වූ කර්මාන්ත 03ක් ප්‍රාග්ධනිත කිරීම නිසා 2016 දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ණයගැතියන් හා කර්මාන්ත ණයහිමියන් රු.841,935 ක් බැගින් මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දැක්වුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල උසාවි දඩ ආදායම රු.9,196,456 ක් වුවත් එය රු.8,870,000 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ අතිරික්තය හා 2016 දෙසැම්බර් 31 දිනට ආදායම් ණයගැතියන් රු.326,456 ක් බැගින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ කෑගල්ල යොවුන් සේනාංකයේ ආචාර පීඨිකාව ඉදිකිරීමට අදාල නිම් වැඩ වටිනාකම වන රු.633,872 ක් ගිණුම්ගත නොකිරීම නිසා 2016 දෙසැම්බර් 31 දිනට ආදායම් ණයගැතියන් හා ණයහිමියන් රු.633,872 ක් බැගින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) එකතුව රු.3,214,511 ක් වූ ආදායම් විෂයයන් 03 ක් නියමිත වැඩසටහන් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම

-------------------------------

ගිණුම් විෂයයන් 02 ට අදාල මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු.1,298,951 වූ අතර ඊට අදාල උපයෝගී ලේඛන / වාර්තා අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.1,294,359 ක් වූයෙන් වෙනස රු.4,592 ක් විය.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ශේෂවල වටිනාකම රු.99,188,074 ක් වූ අතර එයින් රු.17,954,858 ක් වර්ෂයකට වඩා පැරණි ශේෂයන්විය.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.70,794,829 ක් වූ අතර එයින් රු.439,550 ක් වර්ෂයකට වඩා පැරණි ශේෂයන්විය.

1.4 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

----------------------------------------------------

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි විධිවිධාන වලට හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි විධිවිධාන වලට හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මු.රෙ.1646 | සභාව සතු වාහන 09 කට අදාලව ධාවන සටහන් ඉදිරිපත්කර නොතිබුණි. |
| (ආ) | අංක 1597/8 හා 2009 අප්‍රේල් 17 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය | සභා බල ප්‍රදේශය තුළ ඉදිකර ඇති දුරකථන සම්ප්‍රේෂණ කුළුණු 11ක් සඳහා සංවර්ධන බලපත්‍ර ලබාගෙන නොතිබුණි. |

(ඇ) රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම් ගේ අංක 9/2009 හා 2009 අප්‍රේල් 16 දිනැති චක්‍රලේඛය — නිලධාරින්ගේ පැමිණීම හා පිටවීම සනාථ කිරීම පිණිස ඇඟිලි සළකුණු කිරීමේ යන්ත්‍රයක් භාවිතා කළයුතු බව හා එහි වාර්තා තබාගත යුතු බව දක්වා තිබුණද , ඒ අනුව කටයුතු කර නොතිබුණු අතරරු.55,000ක පිරිවැයක් දරා සවිකරන ලද ඇඟිලි සළකුණු කිරීමේ යන්ත්‍රය 2016 අප්‍රේල් සිට අක්‍රීයව පැවතුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල.

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.24,367,221 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.22,502,259 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මුල්‍ය ප්‍රතිඵලයේ රු.1,864,962 ක වර්ධනයක් දක්නට ලැබුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

මුල්‍ය ප්‍රතිඵලයේ රු.1,864,962ක වර්ධනයට ආදායම් විෂයයන් 07ක වැඩිවීම හා වියදම් විෂයයන් 02 ක අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 3.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ බිල්කල ආදායම , තථ්‍ය ආදායම හා හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2016.01.01 දිනට හිඟය | 2016.12.31 දිනට හිඟයෙන් අයකිරීම | 2016 වර්ෂයේ බිල් කිරීම් | වර්ෂයේ බිල්කිරීම් වලින් අයවීම | 2016.12.31 දිනට හිඟය: 2016.01.01 දිනට පැවති හිඟයෙන් හිඟ | 2016.12.31 දිනට හිඟය: වර්ෂයේ බිල් කිරීම් වලින්හිඟය | මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| (i) වරිපනම් හා බදු | 390 | 121 | 3,204 | 2,174 | 269 | 1,030 | 1,299 |
| (ii) බදුකුලී | 223 | 96 | 1,945 | 1,945 | 127 | - | 127 |
| (iii) බලපත්‍ර ගාස්තු | - | - | 1,613 | 1,613 | - | - | - |
| (iv) වෙනත්ආදායම් | 37,392 | 27,764 | 59,569 | 34,861 | 9,628 | 24,708 | 34,336 |
| එකතුව | 38,005 | 27,981 | 66,331 | 40,593 | 10,024 | 25,738 | 35,762 |

2.3.2 බලපත්‍ර ගාස්තු

-----------------

2000 අංක 53 හා 1988 අංක 56 දරන පනත් මගින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත යටතේ ප්‍රකාශිත 1533/16 හා 2008 ජනවාරි 25 දිනැති විශේෂ ගැසට් නිවේදනයට අනුව පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු ව්‍යාපාරික ආයතන 05 ක් විසින් පරිසර බලපත්‍ර ලබා නොගැනීම නිසා සභාවට රු. 20,000 ක ආදායමක් අහිමි වී තිබුණි.

2.3.3 වෙනත් ආදායම්

-------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව සතු ජේ.සී.බී.යන්ත්‍රය අවස්ථා දෙකකදී කුලියට දීම මත සභාවට අයවිය යුතු රු. 40,800ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) දූරකථන සම්ප්‍රේෂණ කුළුණු මගින් එක් කුළුණකට රු.3,000 බැගින් වාර්ෂික බලපත්‍රයක් ලබාගත යුතු වුවත් සභා බල ප්‍රදේශය තුල පිහිටි සම්ප්‍රේෂණ කුළුණු 04 ක් සඳහා බලපත්‍ර ලබානොගැනීම නිසා රු. 12,000 ක ආදායමක් සභාවට අහිමිවී තිබුණි.

(ඇ) සභාවේ අවසර බලපත්‍රයක් ලබා ගැනීමකින් තොරව සභාව අවට වර්ග අඩි 4 ප්‍රමාණයේ බැනර් 15කට වැඩි ප්‍රමාණයක් ප්‍රදර්ශනය කර තිබුණ අතර ඒවායින් ගාස්තු අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.

(ඇ) කරඳුපන හන්දියේ පිහිටි වර්ග අඩි 212 ක් වූ ස්ථාවර ප්‍රචාරක දැන්වීම් පුවරු 03 ක් මත ගාස්තු අය නොකිරීම නිසා සභාවට රු.31,800 ක ආදායමක් අහිමිවී තිබුණි.

2.3.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2016 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු. 5,915,591 ක් හා මුද්දර ගාස්තු රු. 26,150,786 ක් විය.

3. මෙහෙයුම් සමාලෝචනය
----------------------------

3.1 කාර්යසාධනය
-----------------

2016 වර්ෂයේ විමධ්‍යගත අයවැය හා ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන යටතේ ප්‍රතිපාදන වෙන් කරන ලද කර්මාන්ත එම වර්ෂය තුල ආරම්භ කිරීමට අපොහොසත් වීම මත වටිනාකම රු.3,106,243 ක්වූ කර්මාන්ත 15 ක් අවිච්ඡේද කර නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා
------------------------------------

පළාත් පාලන ආයතන විසින් සිදු කරනු ලබන සේවා වලදී භාවිතා කිරීම පිණිස දිවි නැඟුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදන යටතේ ලබාදෙන ලද ගැල්වනයිස් කොඩිකණු 95 ක ඌනතාවයක් දක්නට ලැබුණි.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා
-------------------------------

වාහන වලට අදාල ලොග්පොත් යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි.

3.4 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්
------------------------------------------

සභාව සතු වාහන 02 ක් අවුරුදු 05 හා අවුරුදු 25 ක කාලයක් නිශ්ක්‍රීයව තිබුණද ඒවා අළුත්වැඩියාකර ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

3.5 කොන්ත්‍රාත් පරිපාලනය
--------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පූර්වමිශ්‍ර පිළියෙල කිරීමේදී සභාව යොදාගෙන තිබුණු පිළිගත් තාක්ෂණික ප්‍රමිතිය විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

(ආ) පූර්වමිශ්‍ර පිළියෙල කිරීම සඳහා ද්‍රව්‍ය නිකුත් කිරීමේ ලේඛන අනුව 2015 වර්ෂය හා 2016 වර්ෂයේ පූර්වමිශ්‍ර කියුබ් 93 ක් හා 35 ක් වශයෙන් කියුබ් 128 ක් සැකසිය යුතු වුවද ලේඛන අනුව සකසා තිබුණු කියුබ් ප්‍රමාණය 101 ක් වූයෙන් පූර්වමිශ්‍ර කියුබ් 27 ක ඌනතාවයක් තිබුණි.

(ඈ) පූර්වමිශ්‍ර පිළියෙල කිරීමේදී පස් එකතුවීම පූර්වමිශ්‍ර යෙදීමට පෙර ඇස්තමේන්තු පිළියෙල නොකිරීම , නිපදවනු ලබන පූර්වමිශ්‍ර තොග ලේඛනවල සටහන් නොකිරීම ආදි ඌණතා නිරීක්ෂණය විය.

3.6 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

---------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව විසින්දැනට ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක නොකරන අතර සභා බල ප්‍රදේශය තුලින් එකතු කරනු ලබන කැලි කසල මොරොන්තොට පොල භූමියේ වලක් තුළට බහාලීම සිදුකර තිබුණි.

(ආ) ශක්‍යතා අධ්‍යනයක් සිදු කිරීමකින් තොරව ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා මිලට ගන්නා ලද මොරොන්තොට , හාල්මැස්ස ලුණුගල වත්ත ඉඩමට ප්‍රවේශ මාර්ගයක් හා පාලමක් ඉදිකිරීමට රු.23,970,000 ක පිරිවැයක් දැරියයුතුව තිබූ අතර එවැනි මුදල් ප්‍රමාණයක් සභාව සතුව නොතිබීම හා වෙනත් ආයතනයකින් ප්‍රතිපාදන ලබා නොදීම මත ඉඩම් මිලට ගැනීමට හා අනෙකුත් වියදම් වෙනුවෙන් මෙතෙක් දරන ලද රු.4,286,322 ක මුදල නිෂ්කාර්යව පවතී.

4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

----------------------------------------

4.1 අයවැය පාලනය

--------------------

සමාලෝචිත වර්ෂයට අදාල අයවැය ලේඛනය මගින් ප්‍රතිපාදන සලසා තිබුණු වැය විෂයන් 08 ක එකතුව රු. 414,500 ක ප්‍රතිපාදන සියයට 100 ක් හා වැය විෂයයන් 09 කට අදාලව ප්‍රතිපාදන වලින් සියයට 46 ත් සියයට 97 ත් අතර ප්‍රතිශතයකට සමානව රු.1,075,016 ක් උපයෝජනය කර නොතිබුණි.

4.2 අභ්‍යන්තර විගණනය

1988 ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 5 (7) රීතිය ප්‍රකාරව මුල්‍ය හා ගබඩා සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් පවත්වාගෙන නොතිබුණි.

5. පද්ධති හා පාලන

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

| | <u>පද්ධතිය</u> | <u>නිරීක්ෂණය</u> |
|---|---|---|
| (අ) | වත්කම් පාලනය | (i) යන්ත්‍රසූත්‍ර හා වාහන නිසි පරිදි භාවිතයට නොගැනීම |
| | | (ii) තොග ලේඛන නිවැරදිව පවත්වා නොගැනීම |
| (ආ) | අභ්‍යන්තර පාලනය හා පරීක්ෂාව | (i) අභ්‍යන්තර විගණනය නිසි පරිදි ක්‍රියාත්මක නොකිරීම |
| | | (ii) ආයතනයේ නිලධාරින්ගේ පැමිණීම හා පිටවීම නිසි පරිදි සටහන් නොකිරීම |
| (ඇ) | ණයගැති පාලනය | (i) වර්ෂය අවසානයට වඩාත් නිවැරදි වටිනාකම සැලකිල්ලට ගෙන ණයගැතියන් ලෙස වෙන් නොකිරීම |
| | | (ii) උසාවි දඩ , මුද්දර ගාස්තු හා කර්මාන්ත ආධාරවල නිවැරදි වටිනාකම් ගිණුම්ගත නොකිරීම |
| (ඈ) | ආදායම් පරිපාලනය | (i) දැන්වීම් පුවරු ආදායම් අයකර නොගැනීම |
| | | (ii) විශාල පාරිසරික බලපෑමක් වන සම්ප්‍රේෂණ කුළුණු ආදායම් අයකර නොගැනීම |
| (ඉ) | ණයහිමි පාලනය | (i) ණයහිමි ප්‍රතිපාදන නියමිත පරිදි සිදු නොකිරීම |
| | | (ii) දිගුකාලීනව නොපියවූ ණයහිමි ශේෂ පැවතීම |